


## 3ZZZ ගුවන් විදුලිය සහ ශ්‍රාවක අපි !

සෑම ඉරුදිනකම පෙරවරු 08.00 ට විකාශනය වන 3ZZZ ගුවන් විදුලි වැඩසටහන අරභයා පසුගිය කාලයේ නොයෙකුත් මති මතාන්තර පැතිර යමින් තිබුණි. යුද වාදයට සහාය ලබාදීම හෝ එවැනි අදහස් දරණ කිහිප-දෙනෙකුගේ හෝ සංවිධානයක අත කොළුවක් වී ඇතැයි යන්න ඉන් ප්‍රධාන තැනක් ගත් අතර, මාධ්‍යවේදීන් ගේ භාෂා පරිහරණය සහ වැඩසටහන් මෙහෙයවීම ගැනද පිළිකුලින් යුතුව ප්‍රතිචාර දැක්වීම්ද දැකිය හැකිවිය. සමහර අවස්ථාවල පැවති සජීවී ගුවන් විදුලි සංවාද අතරේද මෙය දැක ගැනීමට හැකිවිය.

උක්ත විරෝධතා හෝ පැමිණිලි වල යම් සත්‍යතාවයක් තිබිය හැකි නමුත් සමිති සමාගම් හා සමාජයේ යම් මෙහෙවරක් වෙනුවෙන් පෙනී සිටින අය අතර දුරදිග ඇදී යන ආරවුලක් දක්වා මෙම තත්ත්වය වර්ධනය නොවිය යුතු ය.

සෑම ඉරුදිනකම උදයෙන්ම අවදි වී සතිපතා ගුවන් විදුලිය පවත්වා ගෙන යාම වෙනුවෙන් ඉතා විශාල කැපකිරීමක් කල යුතුව ඇත. වැඩසටහන් සම්පාදනය, ප්‍රවෘත්ති එක්රැස් කිරීම, සම්මුඛ සාකච්ඡා පටිගත කිරීම, ආදි නොයෙකුත් කරුණු කාරණා වෙනුවෙන් සතිය පුරාම වෙහෙස මහන්සි විය යුතුය. අධිවේගී දිවි පෙවෙතක් ගත කරන අප හැමට එසේ කැපවිය නොහැක. එබැවි-න් අඩුපාඩු මධ්‍යයේ වුවද ගුවන් විදුලිය පවත්වාගෙන යන අයට කෘතවේදී විය යුතුය.

මෙවැනි ගුවන් කාලයක් අපට ලබා දී ඇත්තේ දැනුම, තොරතුරු, ජන සමූහයා අතර සන්නිවේදනය, ප්‍රජා කටයුතු දිරිගැන්වීම හා දැනුවත් කිරීම ආදී බොහෝ කරුණු මුල් කරගෙනයි. ඉන් ප්‍රධාන වන්නේ ශ්‍රාවකයාගේ දැනුම නොයෙක් අංශ වලින් වර්ධනය කිරීමයි. විනෝදය වෙනුවෙන්ම කැපවුණු තවත් ගුවන් විදුලි වැඩසටහන් කිහිපයක්ම ප්‍රචාරය වන බැවින් හුදු විනෝදය සොයන ශ්‍රාවක භවතුන්ට ඒ වැඩසටහන් වලට සවන් දිය හැකිය. 3ZZZ ගුවන් විදුලියෙන් එම නිසා වැඩි කාලයක් දැනුම වෙනුවෙන් කැප විය යුතු යයි හඟිමි. මෙහිදී ගම්‍ය වන ප්‍රශ්නය නම් ශ්‍රාවකයාට ලබාදිය යුත්තේ කිනම් දැනුම් ද යන්නයි. දේශපාලනය, ආර්ථික, සමාජ, කලා හා සාහිත්‍ය ආදී සියල්ල මෙම දැනුම නමැති ප්‍රපංචයට අයත්ය.

මිනිසා යනු දේශපාලන සත්වයෙකි යි විද්‍යාඥ ඇල්බට් අයින්ටයින් ප්‍රකාශ කළේ නිකමටම නොවේ. අප ජීවිත කාලය තුළ ගන්නා සියළුම තීරණ, අරමුණු පිටුපස මෙම සත්‍යය ගැබ්වී ඇත. තමා කනබොන, අඳින පළඳින, මිලට ගන්නා නිවාස යාන වාහන ඇසුරු කරන සමාජය ආදී මෙකී නොකී සෑම දෙයකටම අනිවාර්යයෙන් බද්ධ වී ඇත්තේ දේශපාලනය ම වේ. එබැවින් 3ZZZ ගුවන් විදුලියට ද එය වලංගුය. එබැවින් ඒ සඳහා කාලය වැඩි කොටසක් වෙන් කිරීම අවශ්‍ය වේ.

ඊළඟට අප හමුවේ ඇතිවන ප්‍රශ්නය නම් කල යුත්තේ කුමන දේශපාලනයක්ද? යන්නයි. වරද්දා ගන්නේ මෙතැනදීය. ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් තුළ කල යුත්තේ ප්‍රජාතන්ත්‍රවාදීම වූ දේශපාලන කතිකා-වකි. ශ්‍රී ලංකාවේ දැනට පවතින යුද්ධමය වාතාවරණය හා සම්බන්ධ වාර්තා, ප්‍රවෘත්ති හා අනෙකුත් සම්මුඛ සාකච්ඡා ගුවන් ගත කිරීම අනිවාර්ය නමුත් එම ක්‍රියාදාමය තුළ 3ZZZ ගුවන් විදුලිය හැසි-රුනේ ප්‍රජාතන්ත්‍රවාදීව ද යන ප්‍රශ්නය ඇසිය යුතුව ඇත. ඒ නිසයි වෙනත් සංවිධානයක හෝ පුද්ගලයින් කිහිප දෙනෙකුගේ අතකොළුවක් වී ඇතැයි යන චෝදනාව 3ZZZ ගුවන් විදුලිය මෙහෙය වූ අයට අසන්නට ලැබුනේ.

ගුවන් විදුලියක් පවත්වාගෙන යාමේදී විශේෂයෙන් මාධ්‍ය හසුරුවන්නන් හට මනා සංයමයක්, ස්වයං වාරණයක්, ඉවසීමක්, භාෂාව හැසිරවීමේ දැනුමක් සහ හැකියාවක් ආදී විශේෂිත වූ ගුණාංග තිබිය යුතුය. ආධුනික තත්ත්වයෙන් දිනෙන් දිනම මිදීමට වඩ වඩා උනන්දු විය යුතුය. උගත යුතුය. සවන් දිය යුතුය. එවැනි තත්ත්වයක් නොපෙන්වීමත් 3ZZZ මාධ්‍යවේදීන් වෙත චෝදනා කිරීමට හේතුවී ඇත. නමුත් ඒ තත්ත්වය වෙනස් කර ගැනුම ඉතා අමාරු කාර්යයක් නොවේ.

3ZZZ මාධ්‍යවේදීන්ට ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනය වෙනුවෙන් කැපවීමට කාලය පැමිණ ඇත. ගුවන් කාලය නිසි ලෙස කළමණාකරණය කිරීම, වැඩසටහන් සමබර අයුරින් සතියෙන් සතිය වෙනස් කිරීම, සම්මුඛ සාකච්ඡා සෑම පක්ෂයක් වෙනුවෙන්ම සමාන ලෙස ලබාදීම, ප්‍රජා කටයුතු වෙනුවෙන් අවශ්‍ය ප්‍රමාණයට කාලය ලබාදීම, අතරින් පතර විනෝදය උදෙසා උසස් මට්ටමට ප්‍රතිචාර ලබාගත් ගීත, කවි, රචනා හෝ වෙනත් සාහිත්‍ය අංග වෙනුවෙන් නිසි කාලයක් වෙන් කිරීම, ප්‍රවෘත්ති නිතරම නියමිත වේලාවටම හා නිවැරදි වැදගත්ම පුවත් වලින්ද සපිරි අංගයක් වීම ආදී කරුණු කෙරෙහි අවධානය කිරීම අත්‍යවශ්‍ය වී ඇත. මේ හැම දෙයකම අවසාන අරමුණ විය යුත්තේ ශ්‍රාවක ප්‍රජාවගේ දැනුම වර්ධනයයි. නැතහොත් සිදු වන්නේ හිමිදිරි පාන්දර අවදි වී නොයෙකුත් පෞද්ගලික වැඩ කටයුතු පසෙකලා කැප කිරීමකින් කෙරෙන මෙම කාර්යය කිරි කළයක් දොවා ගොම බිඳක් මුහු කරන්නා වාගේ වැඩකි.

මාධ්‍යවේදීන්ට අවශ්‍ය උපකාර හා දැනුම මෙරටට සංක්‍රමණය වී සිටින නොයෙක් වෘත්තීන් හි ප්‍රවීන මහත්ම මහත්මීන්ගෙන් අසා දැනගෙන ඒ ගැන දැනුවත් වී වැඩසටහන් සම්පාදනය කිරීමේ නිහතමානී බව අවශ්‍යය. ජාතීන් අතර මිත්‍රත්වය වර්ධනය කිරීමට අවශ්‍ය වන මං පෙත් විවර කර ගත යුතුය.

මේ වනවිට 3ZZZ ගුවන් විදුලි කමිටුවට නව නිලධාරී මණ්ඩලයක් පත්වී ඇති බව දනිමි. ඔබට ඇති සීමිත කාලය තුළ අසීමිත වැඩ කොටසක් යෙදී ඇත. මහ සයුරේ අතරමං වූ නෞකාවන්ට ගොඩබිම කරා යාමට මග පෙන්වන ප්‍රදීපස්ථම්බයක් වීමයි ඔබගේ කාර්යය. මෙතෙක් කාලයක් නන් අයුරින් ඉරිදා ගුවන් විදුලිය ගුවනේ රඳවා ගැනීමට දායක වී ඇති සියළුම මහත්ම මහත්මීන්ට ස්තුතියි.

**පංකජ්**



## මේ අපේ දරුවා ය
## ඔහු පතන්නේ ඔබේ සෙනෙහසයි

එබැවින් ඔහු අවදිව සිටින සෑම මො-හොතකම ඔහු පිළිබඳ ඉතා සුපරීක්ෂාකාරීව සිටීමට සිදුවී තිබේ. මේ සියළු තත්ත්වයන් හමුවේ ශ්‍රී ලංකාව තුළ මේ රෝගයට ප්‍රතිකාර කල නොහැකි බැවින් දරුවාගේ දෙමව්පියන් දැන් මෙල්බර්න් වලට පැමිණ තිබේ. මේ වනවිට දරුවාට ප්‍රතිකාර කරනු ලබන්නේ රෝයල් චිල්ඩ්‍රන් රෝහලේදීය.

ඔබ මේ දකින්නේ අපට නුහුරු රෝගී තත්ත්වයක පසුවන කෙවින් ඇංජලෝ ලදරුවයි. බාහිරව කිසිදු වෙනසක් නොපෙනුනද ඔහුට ඇත්තේ අසාමාන්‍ය රෝගී තත්ත්වයකි. ඒ පිළිබඳව සන්නස කළ සොයා බැලීමේදී දැන ගන්නට ලැබුන තොරතුරු ඔබගේ අවධානයට යොමු කිරීම වැදගත් සේ සිතුවෙමු. එය ඔබටත් දරුවාගේ දෙමව්පියන්ගේ අවශ්‍යතාවයන්ට රුකුලත් වේ යයිද සිතන්නෙමු.

කෙවින් ලදරුවාට වැලදී ඇත්තේ හීමෝෆිලියා හෙවත් රුධිරයේ ෆැක්ටර් ප්‍රතිශතය අඩුවීමේ ප්‍රවනතාවයි. එහි ප්‍රතිඵලය වන්නේ ඉතා සුළු තුවාලවීමකදී වුවද ලේ ගැලීම නොනැවතීමය. රුධිරය කැටි නොගැසීමයි. මේ තත්ත්වය සමනය කිරීමට නම් එනම් ෆැක්ටර් ප්‍රතිශතය අවශ්‍ය මට්ටමේ තබා ගැනීමට ඔහුට සතිපතා එන්නත් ලබා දිය යුතුය. එය ශ්‍රී ලංකාවේදී නම් 1 ක් රු. 17000.00 පමණ මිලක් වන අතර මෙහිදී 210.00 පමණ වේ. අනෙක් කරුන නම් මේ දරුවාට දුව පැන නිදහසේ සෙල්ලම් කිරීමට ඇති ඉඩ සීමා වී තිබීමයි. එයට හේතුව වන්නේ ඔහුගේ ශරීරය කොතනක තදින් වැදුනොත් එය ශරීරය අභ්‍යන්තරයේ ලේ ගැලීමකට මුල් වීමට ඉඩ ඇති වීමයි.

ඔවුන් මෙහි පැමිණියේ මාසයක පමණ ප්‍රතිකාර කාලයක් සඳහා වුවද මෙහි වෛද්‍යවරුන් ගේ නිගමනය වී ඇත්තේ ඔහුට ශල්‍යකර්මයක් කළ යුතු බවයි. එබැවින් ඔවුන්ගේ මෙහි නැවතීමේ කාල සීමාවද දික් වී තිබේ. මේ අනපේක්ෂිත සිදුවීම් නිසා දරුවාගේ දෙමව්පියන් පත් වී ඇත්තේ මෙල්බර්න් හි වෙසෙන ඔබගේ ආධාරය උපකාරය ලැබිය යුතු තත්ත්වයකටය. **ශල්‍යකර්මය සඳහා ගෙවිය යුතු රෝහල් ගාස්තු හා ගෙවීම සඳහා මේ මස 24 වෙනිදාට පෙර ඔවුන් ඊට අවශ්‍ය මුදල සොයා ගත යුතුව තිබේ.** මෙල්බර්න් හි වාසය කරන ඔබට සහෝදර ශ්‍රී ලාංකා වැසියනට උදව් උපකාර කිරීම අරුමයක් නොවේ. දැන් ඔබේ උපකාරය කෙවින් ළදරුවාගේ පවුල ට අවශ්‍යවතිබේ. ඒ සඳහා ඔබ හැකි අයුරින් දායක වනු ඇතැයි අපි සිතන්නෙමු. ඒ සඳහා ගිනුම් අංකයක්ද අප වෙත ලබා දී ඇත.

අසේල බර්නාඩ් කුමාරසිංහ (මිය)
BSB - 01304
AC No. 517368051
Au2 BANK
ELEZEBETH STREET
Tele : 0423661944

## දායකත්වය ලබාගෙන සන්නස තැපෑලෙන් ගෙදරටම ගෙන්වා ගන්න

ඔස්ට්‍රේලියාව තුළ වසරක දායකත්වය ඩොලර් 30 කි.
වෙනත් රටවල් සඳහා වසරකට ඔස්ට්‍රේලියානු ඩොලර් 45 කි
සියළුම චෙක්පත්, මුදල් ඇනවුම් **Sannasa News Group** නමට ලියන්න

### දායකත්ව කූපනය

ඔබේ නම. ..............................................................................................

ඔබේ ලිපිනය (ඉංග්‍රීසියෙන් ලියන්න) ..............................................................................................

..............................................................................................

දුරකථන අංකය ..............................................................................................

දිනය ......................................

STANHOPE PRINTING
FOR OFFSET AND DIGITAL PRINTING
සිඩ්නි සහ මෙල්බර්න් ශ්‍රී ලාංකිකයනට කදිම අවස්ථාවක්

- Labels
- School Magazines
- News Letters
- Business Stationery
- Annual Reports
- Special Publications
- Posteres
- Brochures
- Greeting Cards
- Business Cards
- Flyers
- Price Lists

ALL YOUR PRINTING NEEDS....

ඔබගේ සියලුම මුද්‍රණ කටයුතු සඳහා පහත සඳහන් අංකයනට අමතන්න
මුද්‍රණ ඇනවුම් සඳහා තැපැල් ගාස්තුවලට අයකිරීමක් නොමැත
LAKSHMAN
TEL.(02) 9626 7660
MOB.0405287243

RECON BUMPERS
All Types of Bumper Bar Recondition And Spray Painting
දැන් ඕනෑම වර්ගයක
වාහන බම්පර් බාර් අලුත්වැඩියා කිරීම
හා ස්ප්‍රේ පේන්ට් කරගැනීම
සඳහා ඔබ යා යුතු එකම ස්ථානය



විමසීම්
රාමනායක 0404 059 027
RECON BUMPERS
61/4 Lonsdale St
Dandenong
- ශ්‍රී ලාංකික සුහද සේවය -